සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/Notice/D/Div/2024 | ඔබගේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.05.08 |

WBB/Circular/No-11/2024

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් සහ
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත

<u>වැඩිහිටි දීමනා, වකුගඩු රෝගී දීමනා හා ආබාධිත පුද්ගල දීමනා ගෙවීම</u>

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ හිමි, පවුල්වලට අයත් වැඩිහිටි පුද්ගලයින්, රෝගය හඳුනා නොගත් වකුගඩු රෝගීන් හා ආබාධිත පුද්ගලයින් සඳහා වූ දීමනා ගෙවීම සඳහා භාවිතා කළ යුතු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමේ තීරණය මෙතෙක් පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නැති අතර එසේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව 2024 ජූලි මස සිට ප්‍රතිලාභ ගෙවීම සිදු කිරීමට අපේක්ෂිත ය.

02. එබැවින් 2024 ජූනි මාසය දක්වා ඉහත වර්ග තුන යටතේ වූ දීමනා ගෙවනු ලබන ක්‍රමවේදය යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවුල්වලට අයත් පුද්ගලයින් ද ඇතුළුව අඛණ්ඩව ගෙවීම සුදුසු බවට කාරුණිකව දන්වමි.

03. 2024 ජූලි මාසයේ සිට අස්වැසුම වැඩසටහන යටතේ සුදුසුකම් ලබා ඇති පුද්ගලයින් සඳහා මෙම දීමනා ගෙවීම ආරම්භ කිරීමත් සමඟ ඒ අතුරින් දැනට ගෙවීම් සිදු කරන ක්‍රමවේදය යටතේ ගෙවීම් ලබන පුද්ගලයින්ගේ එම ගෙවීම් අත්හිටවිය යුතුය. එසේ නොවුණහොත් එකම තැනැත්තාට දෙවරක් ගෙවීමේ වරද සිදු වනු ඇත.

04. මෙම තත්ත්වය යටතේ මීට පෙර ද උපදෙස් දී ඇති පරිදි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දැනට ප්‍රතිලාභ ගෙවන පුද්ගලයින්ගේ ලැයිස්තු ලබා ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත ව සිටින සමාජ සේවා නිලධාරීන් හා වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරීන් සහ එම විෂයයන් සඳහා අනුයුක්ත කර සිටින වෙනත් සංවර්ධන නිලධාරීන් මඟින් අස්වැසුම වැඩසටහන යටතේ මෙම වර්ග තුනට අයත් දීමනා ලැබීමට සුදුසුකම් ලබා ඇති පුද්ගලයින්ගේ ලැයිස්තුව සමඟ සැසඳීමක් සිදු කළ යුතු යි.

05. මෙම සැසඳීම සිදුකිරීම සඳහා අස්වැසුම වැඩසටහන යටතේ මෙම දීමනා සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයින් තෝරා අනුමත කර තිබිය යුතුයි. මගේ මීට පෙර චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි ඉහත කී ක්ෂේත්‍ර නිලධාරීන් යොදවාගෙන ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරමින් සුදුසුකම්ලාභී පුද්ගලයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2024 ජූනි 10 දින වන විට අවසන් කළ

Scanned with CamScanner

යුතු බව කාරුණිකව දන්වමි. මැයි මස 20 දින සිට දෙවන අදියරේ නිවාස සංගණන ක්‍රියාවලිය ද ආරම්භ වන බැවින් ඊට සමගාමීව මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ කාර්යය ද ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු වේ. ක්ෂේත්‍ර පරීක්ෂණවලින් අනතුරුව දැනට සකස් කර IWMS පද්ධතිය තුළ ඉහත කී තුන් වර්ගයට අයත් දීමනා සඳහා දත්ත ඇතුළත් කිරීමේ ක්‍රමවේදය යටතේ දත්ත හා අදාළ සහතික කළ ඡායාරූප ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම්වරුන් අනුමැතිය ලබා දිය යුතුයි. එසේ සකස් කරනු ලබන සුදුසුකම්ලාභී ලැයිස්තුව සමඟ දැනට දීමනා ලබන්නන්ගේ ලැයිස්තුව සුදුසු ක්‍රමවේදයක් යටතේ භෞතිකව හෝ පරීක්ෂා කළ යුතුයි. එසේ පරීක්ෂා කර පවත්නා ක්‍රමවේදය යටතේ පමණක් දීමනා ලබන්නන් වෙනම වෙන් කර ගෙන ඉදිරිපත් කළ යුතුයි. ඒ අනුව අස්වැසුම යටතේ ප්‍රතිලාභ ලබන පුද්ගලයින් අතහැර ඉතිරි සුදුස්සන් සඳහා 2024 ජූලි මස සිට පැරණි ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ.

06. මෙම ක්‍රියාවලියේ දී සැලකිල්ලට ගත යුතු එක් වැදගත් කරුණක් වන්නේ අස්වැසුම වැඩසටහන යටතේ එකම පවුලේ වැඩිහිටි පුද්ගලයින් එක් අයකුට වැඩියෙන් සිටිය හොත් එම සියළුම දෙනාට දීමනාව බවත් වකුගඩු රෝගීන් හෝ ආබාධිත පුද්ගලයින් සිටිය හොත් එම අයට ද එම දීමනාව ද හිමිවන බවත් ය. එකම පුද්ගලයාට එකම දීමනාවකට වඩා වැඩි ගණනක් වුව ද හිමි විය හැක. ඊට අතිරේකව එම පවුලට හිමි අස්වැසුම දීමනාව ද ලබා ගත හැක.

07. අස්වැසුම වැඩසටහන යටතේ ඉහත වර්ග තුනට අයත් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පරිගණක පද්ධතිය යොදා ගන්නා අන්දම පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශ සහ Zoom තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීම සිදු කිරීමට නියමිත බව කාරුණිකව සලකන්න.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

Scanned with CamScanner